# වර්තමානයේ අභියෝගයට ලක් වෙමින් පවතින සම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස කුඹල් කර්මාන්තය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (නාඋල - දොඩංඅත්තාවල වළං ගම්මානය ඇසුරින්)

චතුරිකා එච්.ඒ.ඩබ්ලිව්. සහ මල්ලවආරච්චි එම්.ඒ.එන්.පී.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
wasanthichathurika96@gmail.com

**සාරසංක්ෂේපය**

සම්ප්‍රදායිකව පැවතගෙන එන පාරම්පරික කර්මාන්තයක් ලෙස කුඹල් කර්මාන්තය හැඳින්විය හැකිය. වර්තමානයේදී කුඹල් කර්මාන්තය දිවයිනේ ප්‍රදේශ කිහිපයකට සීමා වී ඇති අතර සම්ප්‍රදායික තාක්ෂණයෙන් මිදී නවීන ක්‍රම භාවිත කිරීමට යොමු වී ඇත. සම්ප්‍රදායික කුඹල් කර්මාන්තය ප්‍රචලිතව පවතින නාඋල - දොඩංඅත්තාවල ප්‍රදේශය මෙම අධ්‍යයනයේ අධ්‍යයන ක්ෂේත්‍රය විය. සම්ප්‍රදායික කුඹල් කර්මාන්තයේ වර්තමාන ස්වරූපය හා අනාගත පැවැත්ම කෙරෙහි එල්ල වී ඇති අභියෝග පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු විය. නාඋල - දොඩංඅත්තාවල වළං ගම්මානය තුළින් කුඹල් කර්මාන්තය ආශ්‍රිතව සම්ප්‍රදායිකව පැවති ශිල්ප ක්‍රම, වර්තමානයේ දී හඳුනා ගත හැකිද? යන්න පර්යේෂණ ගැටලුව විය. මෙහි දී ප්‍රාථමික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණයන්, ද්විතීයික දත්ත ලෙස පොත්, පුවත්පත් වාර්තා, අන්තර්ජාල ප්‍රකාශන භාවිත කෙරිණි. දොඩංඅත්තාවල වළං ගම්මානයේ වෙසෙන්නන් අතින් නිමැවෙන නිෂ්පාදන අතර කලගෙඩි, නැඹිලි, කොරස්, මුට්ටි, ඇතිලි, ලොකු හට්ටි මෙන්ම විසිතුරු භාණ්ඩ ද වේ. මෙම සම්ප්‍රදායික කුඹල් කර්මාන්තය වර්තමානයේදී වියැකී යමින් පවතින අතර බොහෝ පිරිස් ඇලුමිනියම් භාණ්ඩ මිලදී ගැනීම කුඹල් කර්මාන්තය පවත්වාගෙන යාමට බාධාවක් වී තිබේ. මෙහි දී සම්මුඛ සාකච්ඡා හා සාහිත්‍ය මූලාශ්‍ර මගින් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී නිෂ්පාදන අලෙවි කිරීමේ කටයුතුවලට පහසුකම් නොමැති වීම, සම්ප්‍රදායික කුඹල් කර්මාන්තකරුවන් වෙනත් කර්මාන්තයන්ට නැඹුරු වීම හා නූතන පරම්පරාව මෙම සම්ප්‍රදායික දැනුම ලබා ගැනීමට අකමැති වීම, විදුලියෙන් ක්‍රියා කරන පෝරු හා මැටි අනා ගැනීමේ යන්ත්‍ර යොදා ගත්ත ද ඒ සම්බන්ධ ශිල්පඥානයේ මදිකම යනාදිය කුඹල් කර්මාන්තයට එල්ල වී ඇති අභියෝග හා තර්ජන ලෙස හඳුනා ගත හැකිය. බොහෝ පිරිසක් මැටි වළං භාවිතයෙන් ඉවත් වී ඇලුමිනියම් භාණ්ඩවල ඉවුම් පිහුම් කටයුතු සිදු කරන අතර එය එම ප්‍රදේශවල වකුගඩු අවදානම ද ඉහළ යෑමට හේතුවක් ලෙස හඳුනා ගත හැකිය. මැටි වළං භාවිතය පිළිබඳ ප්‍රදේශවාසීන් තුළ පෙළඹවීමක් ඇති කිරීමට රාජ්‍ය අංශ මැදිහත් වීම කුඹල් කර්මාන්තයේ පැවැත්ම ආරක්ෂා කිරීමට වැදගත් වේ. මේ අනුව සම්ප්‍රදායික කුඹල් කර්මාන්තය වත්මන් සමාජයේ නව්‍යකරණයත් සමග ක්‍රමයෙන් වියැකී යමින් පවතින බව ද පෙනී යයි.

**ප්‍රමුඛ පද:** *කුඹල් කර්මාන්තය, සම්ප්‍රදායික, කර්මාන්තකරුවන්, ඇලුමිනියම් භාණ්ඩ, නව්‍යකරණය*